# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

# 2013 අප්‍රේල් මස 09 වන දින පෙ.ව 9.30ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්විම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

**01. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් 2013.02.19 දින අසන ලද ප්‍රශ්නය:**

(ප්‍ර/V (01)13/03)

අ. බත්තරමුල්ල බටපොත ශ්‍රී සුදර්ශන විද්‍යාලය සපිරි පාසැල් ව්‍යාපෘතියට ඇතුළත් වී තිබේද?

ආ. ඒ අනුව එහි ද්වීතියික අංශය ඉවත් කිරීම අරඹන්නේ කවර වර්ෂයක සිටද ?

ඇ. එම පාසල සපිරි පාසල් ව්‍යාපෘතියට ඇතුළත් කිරීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපයේ පළාත් සභා මන්ත්‍රී කමිටුවේ අනුමැතිය ලබා දී තිබේද?

ඈ. එම පාසලින් ද්වීතියික පංති ඉවත් කිරීම වැළැක්විම වෙනුවෙන් 2013.02.03 දින විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය විසින් උපහාර උත්සවයක් පැවැත්වීද?

ඉ. ඒ සඳහා එම විදුහලේ විදුහල්පතිවරයා සම්බන්ධවීද ?

ඊ. එහිදී උපහාර ලැබූ අය කවුද ?

**02. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් 2013.02.19 දින අසන ලද ප්‍රශ්නය: (ප්‍ර/V (1)13/04)**

2005 සිට 2012 දක්වා කළුතර අධ්‍යාපන කලාපයේ අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයේදී,

ආ. එක් එක් විෂය සඳහා පෙනී සිටි සිසුන් ගණන,

ඇ. එක් එක් විෂය සමත් වූ ප්‍රමාණය ,

ඈ. එක් එක් විෂය සඳහා සමත්වීමේ ප්‍රතිශතය,

මෙම පළාත් සභාවට ඉදිරිපත් කරන්නේද?

**03. ගරු මංජු ශ්‍රී අරංගල විපක්ෂනායකතුමා විසින් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන්** 2013.03.19 **දින අසන ලද ප්‍රශ්නය: (ප්‍ර/V(1)13/05)**

අ. 2010 වර්ෂය සඳහා බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව නූල් මිලදී ගත් ආයතනය නම් කරන්නේද ?

ආ. එම නූල් වර්ණ ගැන්වීම කරන ලද ආයතනය නම් කරන්නේද ?

ඇ. නූල් මිලදී ගත් ආයතනයෙන්ම වර්ණ ගැන්වීම කළ බව පිළිගන්නේද ?

ඈ. මිලදී ගත් නූල් මහර ගබඩාව වෙත එම ප්‍රමාණයෙන්ම ලැබී නැති බව පිළිගන්නේද ?

ඉ. එසේ මිලදී ගත් නූල් වලින් මහර ගබඩාව වෙත නොලැබුණ නූල් ප්‍රමාණය කොතෙක්ද?

ඊ. මෙහිදී සිදුවී ඇති බරපතල අක්‍රමිකතාවය පිළිබඳ අල්ලස් හෝ දූෂණ කොමිසම මඟින් පරීක්ෂණයක් පවත්වන බව පිළිගන්නේද?

උ. එසේ නම් එහි ප්‍රගතිය පැහැදිලි කරන්නේද?

ඌ. මෙම අක්‍රමිකතාවයට සම්බන්ධ නිලධාරීන් පිළිබඳ දෙපාර්තමේන්තු මට්ටමින් විනය පරීක්ෂණයක් පවත්වන්නේද?

එ. නොඑසේනම් ඒ මන්ද ?

04. **ගරු ඊ.සිරිකමල් පිලිෂියන්ද සිල්වා මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු සංස්කෘතික හා කලා කටයුතු සමූපකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදාහැරීමේ කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට:** (ප්‍ර/V (1)13/06)

අ. වත්තල-ඇලකන්ද මංසන්ධියේ පෞද්ගලික බස් නවතා තැබීම නිසා විශාල අවහිරතායක් ඇතිවන බව ඔබතුමා දන්නවාද ?

ආ. මෙම අවහිරතාවය මහ හරවා ගැනීමට සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමට සැලසුමක් තිබේද?

ඇ. එසේනම් එම සැලසුම සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් තර තිබේද ?

ඇ. නොඑසේනම් මෙම අපහසුතාවය මහහරවා ගැනීමට ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. සභාවේ රැස්වීම්

**ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට**

යෝජනාව :

"**2013.03.19** දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී එළඹුණු එකඟතාවයට අනුව අද දින ( 2013.04.09 දින) විසිරයෑමෙන් අනතුරුව මෙම සභාව **2013.05.07** දින පෙ.ව 9.30 ට රැස්විය යුතු අතර **2013.04.23** දිනය (අඟහරුවාදා දින) සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් ලෙස සලකා ක්‍රියාකළ යුතුය . "

## X. සභාවේ කටයුතු

**ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට**

යෝජනාව :

"2013.03.19 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී මෙම සභාව 2013.04.09 දින විසිර යැමෙන් අනතුරුව 2013.05.07 දින රැස්වීමට එකඟතාවය පළවූ හෙයින්ද 2013.03.27 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලද එකඟතාවය මත අද දින ( 2013.04.09 ) න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයය යටතේ අංක 04හි සඳහන් වැඩ කටයුතු අද දින තුළදීම නිම කිරීමට එකඟතාවය ලද හෙයින්ද, එම වැඩ කටයුතු කෙරෙහි රීති අංක 57(1), 57(4), 57(5)හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය. "

## XI. පොදු කටයුතු

**01. ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප) විසින් ඉදිරිපත් කරනු ලැබීමට**

යෝජනාව :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව
<u>විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත</u>

" ***ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව- විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත,"*** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154උ5(අ) වන ව්‍යවස්ථාව යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත යොමු කර, පළාත් සභාවේ අදහස් 2013 අප්‍රේල් මස 11 වන දිනට හෝ ඊට පෙර පාර්ලිමේන්තුව වෙත වාර්තා කරන ලෙස, 46අ(2)අ වන පාර්ලිමේන්තු ස්ථාවර නියෝගය යටතේ දන්වා ඇති හෙයින් හා එම දැනුම් දීම 2013.03.19 දින පැවති බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා රැස්වීමේදී, නිවේදනය කර, ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන ලදුව එම කාරක සභාවේ වාර්තාවද ලැබී ඇති හෙයින් ඒ පිළිබඳවද සැලකිලිමත්ව, යථෝක්ත පනත් කෙටුම්පත පිළිබඳව තව දුරටත් මෙම පළාත් සභාවේදී සාකච්ඡා කර එළඹෙන තීරණයන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ලබා දීමට ක්‍රියා කළ යුතුය. "

**02. ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප) විසින් ඉදිරිපත් කරනු ලැබීමට**

යෝජනාව :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව
<u>උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත</u>

"***ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව- උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත,*** " ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154උ5(අ) වන ව්‍යවස්ථාව යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත යොමු කර, පළාත් සභාවේ අදහස් 2013 අප්‍රේල් මස 11 වන දිනට හෝ ඊට පෙර පාර්ලිමේන්තුව වෙත වාර්තා කරන ලෙස, 46අ(2)අ වන පාර්ලිමේන්තු ස්ථාවර නියෝගය යටතේ දන්වා ඇති හෙයින් හා එම දැනුම් දීම 2013.03.19 දින පැවති බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා රැස්වීමේදී, නිවේදනය කර, ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන ලදුව එම කාරක සභාවේ වාර්තාවද ලැබී ඇති හෙයින් ඒ පිළිබඳවද සැලකිලිමත්ව, යථොක්ත පනත් කෙටුම්පත පිළිබඳව තව දුරටත් මෙම පළාත් සභාවේදී සාකච්ඡා කර එළඹෙන තීරණයන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ලබා දීමට ක්‍රියා කළ යුතුය "

**03. ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප) විසින් ඉදිරිපත් කරනු ලැබීමට**

යෝජනාව :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව
<u>මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත</u>

"***ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව- මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත,*** " ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154උ5(අ) වන ව්‍යවස්ථාව යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත යොමු කර, පළාත් සභාවේ අදහස් 2013 අප්‍රේල් මස 11 වන දිනට හෝ ඊට පෙර පාර්ලිමේන්තුව වෙත වාර්තා කරන ලෙස, 46අ(2)අ වන පාර්ලිමේන්තු ස්ථාවර නියෝගය යටතේ දන්වා ඇති හෙයින් හා එම දැනුම් දීම 2013.03.19 දින පැවති බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා රැස්වීමේදී, නිවේදනය කර, ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන ලදුව එම කාරක සභාවේ වාර්තාවද ලැබී ඇති හෙයින් ඒ පිළිබඳවද සැලකිලිමත්ව, යථොක්ත පනත් කෙටුම්පත පිළිබඳව තව දුරටත් මෙම පළාත් සභාවේදී සාකච්ඡා කර එළඹෙන තීරණයන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ලබා දීමට ක්‍රියා කළ යුතුය."

**04. ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප) විසින් ඉදිරිපත් කරනු ලැබීමට**

යෝජනාව :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## <u>උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත</u>

" ***ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව- උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත,*** " ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154උ5(අ) වන ව්‍යවස්ථාව යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත යොමු කර, පළාත් සභාවේ අදහස් **2013** අප්‍රේල් මස 22 වන දිනට හෝ ඊට පෙර පාර්ලිමේන්තුව වෙත වාර්තා කරන ලෙස, **46**අ**(2)**අ වන පාර්ලිමේන්තු ස්ථාවර නියෝගය යටතේ **2013** මාර්තු මස **21** දාතමින් දන්වා ඇති හෙයින්, ඒ සම්බන්ධව ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව සාකච්ඡා කිරීමට **2013.03.27** දින රැස්වූ මෙම පළාත් සභාවේ සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී ලද එකඟතාවය මත සභා කාර්ය පටිපාටි රීති අංක **63**ආ**(2)** හා **63**ආ**(3)** යන රීතීන්හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදුනොවිය යුතු යැයි සලකා යථෝක්ත පනත් කෙටුම්පත පිළිබඳව මෙම පළාත් සභාවේදී සාකච්ඡා කර එළඹෙන තීරණයන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ලබා දීමට ක්‍රියා කළ යුතුය."

# XII. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01. ගරු අශෝකා ලංකාතිලක මන්ත්‍රීතුමිය :**

" ලංකාවේ බස් සේවය රජය සතුව තිබියදී එය ගෞරවනීය සේවයක්ව තිබූ බව කවුරුත් පිළිගන්නා කරුණකි. ස්ථිර වැටුපක් සහිතව අත්‍යාවශ්‍ය වරප්‍රසාද එම සේවය කළ සියළු දෙනාටම ලැබුණ අතර ජනතාවද තමාගේ ගෞරවය රැකගෙන ගමන් බිමන් යාමට බිය නැතිව පාරට පැමිණි බව අපි දනිමු.

නමුත් පෞද්ගලික බස් සේවය පටන් ගත් පසු මගීන්ගේ ගෞරවය කෙලෙසා ගෙන එහි ගමන් කළ යුතු අතර කොතරම් කාල සටහන් සකස් කර දුන්නත් ඒවා පිළිපදින අය ඉතාමත් අඩුය. මෑතකදී රජයෙන් බස් ගෙන්වා බස් සේවය ශක්තිමත් කරන්නට යන බව පුවත්පත් වල සඳහන් වී තිබේ. කොතරම් බස් ලංකාවට ගෙන ආවත් රාත්‍රී බස් සේවය ක්‍රියාත්මක නොවෙනවා නම් ජනතාවට පහසුකම් සැලසේ යයි සිතිය නොහැක. එම නිසා රජයේ බස් සේවයට ගෙන්වන එම බස් රථ සාධාරණ සංඛ්‍යාවක් යොදවා පස්වරු 6.00 සිට අවම වශයෙන් රාත්‍රී 11.00 වන තෙක්වත් ජනතාවට මහ මඟ රස්තියාදු නොවී ගමනාගමන අවශ්‍යතාවය ඉටු කර ගැනීමට හැකි බස් සේවයක් ලබා දෙන මෙන් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයෙන් ඉල්ලා සිටියි. "

**(යෝ/v(01)12/18)**

**02. ගරු නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා :**

" බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ ඉදි කර ඇති සියළුම කඩ සාප්පු සංකීර්ණ, රෝහල් ඇතුළු විවිධ ගොඩනැඟිලි හිමියන් විසින් එම ගොඩනැඟිලි සැලසුම් අනුමත කර ගැනීමේදී දෙනු ලබන පොදු පහසුකම් හා රථ ගාල් භාවිතා කරමින් පාරිභෝගිකයන්ගෙන් මුදල් අය කරනු ලැබේ. මෙම රථ ගාල් එම ගොඩනැඟිලි සඳහා අනුමැතිය දීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසි හා පළාත් පාලන ආයතනවල නීති රීති වලට අනුව නියම කරවන අතර, එම පහසුකම් විකිණීම නීති විරෝධී කටයුත්තකි.

එම නිසා, මෙම පොදු පහසුකම් පෞද්ගලික රථ ගාල් ලෙස ජනතාවගෙන් මුදල් ලබා ගැනීම අහෝසි කරවන ලෙසත්, ඉදිරියට එවැනි ආයතනවලට එරෙහිව නඩු පැවරීමට අදාල පළාත් පාලන ආයතන වලට බලය ලබා දෙන ලෙසත් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි"

**(යෝ/v(01)12/19)**

## XIII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.03.27 දින
සභා ලේකම් කාර්යාලය (බ.ප)
බස්නාහිර පළාතේ පළාත් සභාව.
5 වන මහළ, බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

File Name :- C:\Users\ishani maddumage\Documents\Office\Council\Agenda – 2013.03.21 docx